31-03-2026 **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, උසස් තත්ත්වයක් හිමි කරගැනීම සඳහා සෑම විටෙකම සත්‍ය පියාට අවංක වන්න. ඔබ වරදක් සිදු කළේ නම්, පියාගෙන් සමාව අයදින්න. ඔබගේ මනසේ මත පිළි නොපදින්න.

**ප්‍රශ්නය:** සැඟවී සිටිය නොහැක්කේ, කුමන විශේෂයෙන් ආදරණීය වූ දරුවන්ටද?

**පිළිතුර:** පරමාත්ම දෙවියන්ගේ පවුලේ අයට ආදරය කරන, සේවයට ලැදි, දිවා රාත්‍රියේ සේවය කිරීමට සැලකිලිමත් වන, සේවය කළ හැකි, කීකරු සහ විශ්වාසවන්ත, කිසි විටෙක තම මනසේ මත අනුගමනය නොකරන එමෙන්ම අවංක හදවත් ඇති සහ පරමාත්ම පියාට සත්‍යවාදී වන දරුවන්ට, කිසිදා සැඟවී සිටිය නොහැක.

**ගීතය:** මවත් ඔබයි, පියාත් ඔබයි.

ඕම් ශාන්ති. ගීතය සහතික කරන්නේ කුමක්ද? දරුවන්ට සහතිකයක් තිබේ මට සිටින්නේ ඔබ පමණක් මිස වෙනත් කෙනෙක් නොවෙයි. මෙය බොහෝ උසස් අරමුණකි. මෙතරම් ශ්‍රේෂ්ඨ පියෙකුගේ ශ්‍රීමත් පිළිපදින ඕනෑම කෙනෙකුට අනිවාර්යයෙන්ම උසස් තත්ත්වයක් හිමි වීම සහතිකයකි. කෙසේවෙතත්, ගමනාන්තය බොහෝ ඉහළ බව, බුද්ධියට හැඟෙයි. මේ නිසයි, කෝටි ගණනකින්, මාලාවේ පබුළු බවට පත්වන්නේ අතලොස්සක් පමණයි. මෙසේ කියයි මවත් ඔබයි, පියාත් ඔබයි, නමුත් මායා බොහෝ බලවත් බැවින් එම සහතිකය අනුගමනය කළ හැක්කේ ඉතා සුළු පිරිසකට පමණයි. ඔබ සෑම කෙනෙකුටම මෙය තමන්ගෙන්ම විමසිය හැක මා සැබවින්ම මවට සහ පියාට අයත් වී සිටිනවාද? පරම පියා පවසන්නේ නැහැ, සිටින්නේ ඔබගෙන් ඉතාම ටික දෙනෙක් පමණයි. මේ නිසයි මාලාවේ පබුළු කෙතරම් තිබෙනවාද කියා ඔබට දැක ගත හැකි වන්නේ කෝටි ගණනකින් ජයග්‍රහණයේ මාලාවේ සිටින්නේ අට දෙනෙක් පමණයි. සමහරු එක දෙයක් පවසා වෙනත් දෙයක් කරයි. මේ නිසයි පියා මෙසේ පවසන්නේ මෙම අරුමය දෙස බලන්න! බාබා බොහෝ සෙනෙහසින් විස්තර කරන නමුත් වටිනා දරුවන් සිටින්නේ ඉතාමත්ම ටික දෙනෙකි (මාලාවේ පබුළු වන අය). ශ්‍රීමත් අනුගමනය කිරීමට දරුවන්ට එතරම් ශක්තියක් නැත. එබැවින් ඔවුන් නිසැකයෙන්ම රාවණගේ උපදෙස් පිළිපදියි. ඔවුන්ට එතරම් ඉහළ තත්ත්වයක් හිමි කරගැනීමට නොහැකි වන්නේ මේ නිසාය. මාලාවේ පබුළු බවට පත්වන්නේ දුර්ලභ කිහිප දෙනෙක් පමණයි. එවන් විශේෂයෙන් ආදරණීය වූ දරුවන්ට සැඟවී සිටිය නොහැක ඔවුන් බාබාගේ හදවතේ අසුන් ගෙන සිටියි. දිවා රාත්‍රියේ ඔවුන්ගේ එකම සැලකිලිමත් බව වන්නේ, සේවය කිරීමටයි. ඔවුන් පරමාත්ම දෙවියන්ගේ පවුලේ සියල්ලන්ටම ආදරෙයි. ඔවුන්ගේ බුද්ධි, පිටත කොහෙවත් ඇදී යන්නේ නැත. ඔබ තුළ දිව්‍යමය පවුල කෙරෙහි එවන් සෙනෙහසක් තිබිය යුතුයි. අවිඥ මාවතේ වුවද දරුවන් තුළ ඔවුන්ගේ පියා කෙරෙහි බොහෝ සෙනෙහස තිබේ සහෝදර සහෝදරියන් තුළ, එකිනෙකා කෙරෙහි බොහෝ සෙනෙහස තිබේ. මෙහි සමහරුන් පියා සමඟ සුළුවෙන් හෝ යෝගාවේ සිටින්නේ නැත. බොහෝ දෙනෙක් සහතිකයක් දෙන අතර ඔවුන් තවමත් භක්ති මාර්ගයේ මෙය ගායනා කරයි. ඔය දරුවන් දැන් සිටින්නේ පෞද්ගලිකවම පියා ඉදිරියේය. ඒ ගැන ටිකක් සිතා බලන්න භක්ති මාර්ගයේ මිනිසුන් කුමක් ගායනා කළත්, ඔවුන් බොහෝ සෙනෙහසින් යුතුව දෙවියන්ව සිහි කරයි! මෙහිදී, ඔවුන් ඔහුව සිහි නොකරයි. ඔබ බාබාට අයත් වූ විට, මායා ඔබගේ සතුරා වී, බුද්ධිය පිටතට ඇදී යයි. එබැවින් මායා ඔබව ඉතා තදින් පහතට වට්ටයි. තම තමන්ම කරන දේ, තමන්ව වට්ටන බව, ඔවුන්ට වැටහෙන්නේ නැත. තමන්ගේම උපදෙස් පිළිපැදීම නිසා, ඔවුන් දිගටම ඇද වැටෙයි. ඔවුන් කරන්නේ කුමක්ද කියා ඔවුන්ගේ අවධානයේ කිසිසේත් නැත! දරුවන් තුළ දුර්වලතා තිබේ. ඔවුන් එක් දෙයක් පවසා තව දෙයක් කරයි. එසේ නොමැති නම්, ඔවුන්ට පියාගෙන් බොහෝ ශ්‍රේෂ්ඨ උරුමයක් හිමි කර ගත හැක. ඔබ බොහෝ අවංකව පියාගේ සේවයේ නියැලිය යුතුයි. කෙසේවෙතත්, මායා කෙතරම් බලවත්ද කියතොත්, කෝටි ගණනකින් පියාව සම්පූර්ණයෙන්ම හඳුනාගන්නේ අතලොස්සක් පමණයි. පියා පවසන්නේ සෑම චක්‍රයකම මෙයම සිදුවෙයි. ඔවුන් මුළුමනින්ම විශ්වාසනීය හෝ කීකරු නොමැති බැවින්, එම අසරණ අයගේ තත්ත්වය එසේ වෙයි. ඔවුන් පවසන්නේ බාබා, මම රාජයෝගාව ඉගෙනගෙන, සාමාන්‍ය මිනිසෙකුගෙන් නාරායන හෝ සාමාන්‍ය ගැහැණියක ගෙන් ලක්ෂ්මී බවට පත්වන්නම්. මා රාමා හෝ සීතා නොවන්නෙමි. ඔවුන්ගේ දැන් පවා ඔසවයි. කෙසේවෙතත්, එයට ගැලපෙන යම් ක්‍රියාකාරම් ද අවශ්‍ය වෙයි! අසීමිත පියා පැමිණ සිටින්නේ

ඔබගේ උරුමය ඔබට ලබා දීමටයි. ඔබ ඔහුගේ ශ්‍රීමත් පිළිපැදිය යුතුයි. ඔවුන් ශ්‍රීමත් පිළිපදින්නේ නැති බවට, පොරොන්දුවක් වී ඇති බොහෝ දෙනෙක් සිටියි! එවන් ජීවාත්මයන්ට සැඟවී සිටිය නොහැක. එය ඔවුන්ගේ භාග්‍යයේ නොමැති විට, පළමුව ඔවුන් ශරීර අවධානයෙන් පහර කන අතර, ඉන්පසුව රාගයෙන් පහර කයි. රාගය නොමැති නම්, කෝපය හෝ තන්හාව තිබෙයි. මේ සියලුම පාපයන් ඔබගේ සතුරන්ය. බැඳීම්ද කෙබඳුද කියතොත්, එය මුළුමනින්ම සියලු සත්‍යය විනාශ කරදමයි. තන්හාවද අඩු නැත. මේවා බොහෝ බලවත් සතුරන්ය. ඔවුන් පැන්ස කිහිපයක් පමණක් වටින යමක් සොරකම් කරයි. එයද තන්හාවයි. සොරකම් කිරීමේ පුරුද්ද ඉතා නරකයි. ඔබ දිගින් දිගටම පාපයන් සිදු කරන්නේ නම් ඔබගේ යටි සිත වද දෙනු ඇත, එබැවින් ඔබට කුමන තත්ත්වයක් ලැබෙයිද? ශිව බාබාගේ යාගහෝමයට පැමිණීමෙන් පසුව, අප එවන් ක්‍රියා සිදු කරන්නේ කෙසේද? මායා ඔවුන් ලවා බොහෝ වැරදි ක්‍රියා සිදු කරවයි. ඔවුන්ට කෙතරම් පහදා දුන්නත්, ඔවුන්ගේ නරක පුරුදු අත්හරින්නේ නැත. ඇතැමුන් නමෙහි සහ රූපයේ සිර වෙයි. ශරීර අවධානය නිසා, ඔවුන් නමේ සහ රූපයේ සිර වෙයි. බාබා සියලුම මධ්‍යස්ථාන ගැන සෑම දෙයක්ම දන්නවා. බාබා කුමක් කරන්නද? ඔහු පහදා දිය යුතුයි. බොහෝ මධ්‍යස්ථාන තිබේ! බාබාට බොහෝ පුවත් ලැබෙන බැවින් ඔහු බොහෝ සැලකිලිමත් වෙයි. එබැවින් ඔහු පහදා දිය යුතුයි. මායාද අඩු නැත ඇය ඔබට බොහෝ කරදර කරයි. ඉතා හොඳ දරුවන්ට මෙසේ කියයි ඉහළ තානාන්තරයකට ඉල්ලුම් පත්‍රයක් දැමීම යනු බොහෝ දුක් විඳීමය. මෙහි දුක පිළිබඳ ප්‍රශ්නයක් නැත. පෙර කල්පයේද එම දෙයම සිදු වූ බව ඔබට වැටහෙයි. දෙවියන්ට අයත් වීමෙන් පසු, ඔවුන් මායාට හසුවී, ඉන්පසුව එක් හෝ තව පාපකර්මයක් සිදු කරයි. මේ නිසයි පියා පවසන්නේ බොහෝ දරුවන් බාබාට පොරොන්දු වනවා මා අනිවාර්යයෙන්ම ඔබගේ ශ්‍රීමත් පිළිපදිනවා. කෙසේවෙතත්, ඔවුන් ඒවා පිළිපදින්නේ නැත. එබැවින් මාලාව කෙතරම් කුඩාද කියා බලන්න! ඉතිරි සියලු දෙනාම පුරවැසියන්ය. අරමුණ බොහෝ ඉහළයි. මේ සඳහා හදවතේ පිරිසිදුභාවය අවශ්‍යයි. මෙවැනි කියමනකි අවංක බව ඇති විට, හදවත නර්ථනය කරයි. ඔබ පියාට දිගින් දිගටම අවංක වන විට, ඔබ අනිවාර්යයෙන්ම ස්වර්ණමය යුගයේදී ක්‍රිෂ්ණා සමඟ නර්ථනය කරනු ඇත. ක්‍රිෂ්ණාගේ ස්වර්ණමය යුගයේ නර්ථනය ඉතා සුප්‍රසිද්ධය. ඔවුන් රාධේ සහ ක්‍රිෂ්ණාගේ රාස්-ලීලා (දිව්‍යමය ක්‍රියාකාරකම්) නර්ථනය පෙන්වයි. ඉන්පසුව ඔවුන් රාම-ලීලා නර්ථනය, රාමා සහ සීතාගේ දිව්‍යමය ක්‍රියාකාරකම් පෙන්වයි. කෙසේවෙතත් එහි රාධේ සහ ක්‍රිෂ්ණාගේ රාස්-ලීලා අංක එකට ඇත. ඇයි? ඔවුන් මෙකල, පරම පියා සමඟ බොහෝ අවංකව රැඳී සිටින බැවින්. එබැවින් ඔවුන් එතරම් උසස් තත්ත්වයක් හිමි කරගනී. බොහෝ දරුවන් ඔවුන්ගේ දෑත් ඔසවයි. කෙසේවෙතත්, මායා කෙබඳුද? ඔබ දෙන පොරොන්දුව ඉටු කළ යුතුයි. මායාගේ නපුරු භූතයන් පලවා හරින්න! ශරීර අවධානයෙන් පසුව, අනෙක් සියලුම නපුරු භූතයන්ද ඔබට එල්ලී සිටියි. බාබා පවසන්නේ ජීවාත්ම අවධානයට පත් වී පරමාත්ම පියාව සිහි කරන්න. එහිදීද, හිමිදිරි උදෑසන අසුන්ගෙන, බාබාට කතා කරන්න. බාබාව ප්‍රශංසා කරන්න. භක්ති මාර්ගයේ ඔවුන් බොහෝ දෙනෙක් සිහි කරන නමුත්, කිසි කෙනෙකුගේ සැබෑ වර්ණනාවක් නැත. ඔවුන් ක්‍රිෂ්ණාව සිහිකර, ඔහුගේ ප්‍රශංසාව ගායනා කර, ඔහු වෙඬරු සොරකම් කළ බව, ස්ත්‍රීන් පැහැර ගත් බව, අකාසූර් සහ බකාසූර් යන රකුසන් මැරූ බවත් අහවල් දේවල් කළ බවත් කියයි. ඔවුන් වෙන මොනවාද කියන්නේ? ඒ සියලු දේ මුසාවන්! ඒවායේ සත්‍යයේ අවුන්සයක්වත් නැත. එබැවින් ඔහු මාර්ගය පෙන්වන්නේ කෙසේද. ඔවුන් විමුක්තිය ගැන කිසි දෙයක් නොදනී. මෙකල මුළු ලෝකය පුරාම රාවණගේ රාජධානිය තිබේ. මෙකල සෑම කෙනෙක්ම අපවිත්‍රයි. මනුෂ්‍යයන් 'දූෂණය' යන වචනයේ අරුතවත් නොදනී. ස්වර්ණමය යුගයේ පාපයෙන් තොර දේවතාවන් සිටි බවවත් ඔවුන්ට නොවැටහෙයි. ඔවුන් ගයන්නේ ඔබ සියලු ගුණධර්ම වලින් පිරී ඇත, දිව්‍යමය කලා 16 කින් පිරී ඇත. ඒ තිබියදී ඔවුන් පවසන්නේ රාවණ, කාන්ස් ජරාසඳ ආදින්ද එහි සිටින බවයි. ඔවුන්ට පිවිතුරු වීමට කියා කියූ විට, ඔවුන් පවසන්නේ දේවතාවන්ටද දරුවන් සිටි බවයි. ඕ, එනමුත් ඔබ ගයන්නේ ඔබ සියලුම ගුණදම් වලින් පිරී සිටියි, සම්පූර්ණයෙන්ම දූෂණයෙන් තොර බවත්ය, එබැවින් පාපයන් පිළිබඳ ප්‍රශ්නයක් නැඟෙන්නේ කෙසේද? ඔවුන්ට පාපයෙන් තොරව සිටින්නට කියා ඔබ පැවසූ විට, ඔවුන් පිළිතුරු දෙන්නේ ලෝක ජනගහණය වර්ධනය වන්නේ කෙසේද? දරුවන් උපදින්නේ කෙසේද? ඔවුන් දේවාලයේදී ප්‍රශංසා ගයන නමුත් තම නිවෙස් වලට ගිය විට ඔවුන්ට එම ප්‍රශංසාද අමතක වෙයි. ඔබම ගොස් මෙය දැකගන්න! ඔවුන්ගේ නිවෙස් වලට ගොස් ඔබ විස්තර කරන විට ඔවුන් ඔබට සවන් දෙන්නේ නැත. ඔවුන් එහිදී (ප්‍රදර්ශන වල) ඇසූ කුමක් වුවත්, එහිම දමා ඇවිත්! ඔවුන්ට පිවිතුරු වන්නට කියා පවසන්න, එවිට ඔවුන් මෙසේ පිළිතුරු දෙයි අපූරුයි, නමුත් මෙය නොමැතිව ලෝකය පැවතෙන්නේ කෙසේද? පාපයෙන් තොර ලෝකය ක්‍රියාත්මක වන්නේ කෙසේද කියාවත් ඔවුන්ට වැටහෙන්නේ නැත. ඔය දරුවන්ට ගීතය ඇසුණ අතර ඔබ මෙසේද පොරොන්දු විය ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් යහපතක් සිදුවන බැවින් මා ශ්‍රීමත් අනුගමනය කරන්නෙමි. පියා පවසන්නේ ශ්‍රීමත් පිළිපදින්න.

එසේ නැත්නම් මරණය එයි! එවිට අධිකරණයේදී සෑම දෙයක්ම හෙළිදරව් කිරීමට සිදුවෙයි. ඔබ මෙම පාපයන් සිදු කළා. ඔබ තමන්ගේම මත පිළිපැද්ද නිසා සෑම කල්පයකටම මෙම කැළල තිබෙයි. ඔබ එක් වරක් අසමත් වුණොත් ඔබට එවිට දෙවැනි හෝ තෙවැනි වසරේ නැවත ඉගෙනගැනීමට නොහැක. නැහැ, ඔබ දැන් අසමත් වුණොත් ඔබ සෑම කල්පයකදීම අසමත් වෙනවා. ඔබ බොහෝ උත්සාහ දැරිය යුත්තේ මේ නිසාය. සෑම පියවරකදීම ශ්‍රීමත් පිළිපදින්න. ඔබගේ ඇතුලාන්තයේ අපිරිසිදු කිසිවක් නොතිබිය යුතුයි. ඔබගේ හදවත පිවිතුරු සහ පිරිසිදු කරගන්න. ඔහුගේ මුහුණ කැඩපතින් බලාගන්න ලෙස, නාරදට කියන ලදි. ඔහු රිලවෙක් වැනි බව එවිට දුටුවා. එයද නිදසුනක් පමණයි. තමාගෙන් විමසන්න මා කොපමණ දුරට ශ්‍රීමත් පිළිපදිනවාද? මගේ බුද්ධියේ යෝගාව පිටත සැරිසරනවාද? මා ශරීර අවධානයෙන් නැහැ නේද? ජීව අවධානයෙන් සිටින අය, සේවයේ නියැලී සිටියි. සෑම දෙයක්ම රඳා පවතින්නේ යෝගාව මතයි. භාරතයේ යෝගාව ඉතා සුප්‍රසිද්ධයි. අශාරීරික පියා විස්තර කරන්නේ, අශාරීරික දරුවන්ට පමණයි. මෙයට පහසු රාජයෝගාව යැයි කියයි. අශාරීරික පියා පහසු රාජයෝගාව ඉගැන්වූ බව ලියා තිබේ. ඔවුන් ක්‍රිෂ්ණාගේ නම ඇතුලත් කිරීම පමණක් සිදුවුවා. ඔබ ලක්ෂ්මී සහ නාරායන මෙන් විය යුතු බව ඔබ දන්නවා. ඔබ පිවිතුරු සහ පුණ්‍යවන්ත ජීවාත්ම විය යුතුයි. පාපය පිළිබඳ ප්‍රශ්නයක් නැත. පියාගේ සිහිකිරීමේ සිට, ඔහුගේ සේවයේ තමන්ව කාර්යබහුල කරගන්න. ඔබට උසස් තත්ත්වයක් හිමිකර ගැනීමට අවශ්‍ය නම්, ඔබ උත්සාහ දරනවා නේද? නිවසේ තම පවුලේ අය සමඟ වාසය කරමින්, නෙළුම් මලක් මෙන් පිවිතුරුව රැඳී සිටීම කිසිසේත් කළ නොහැකි දෙයක් බව, සන්‍යාසීන් කියයි. ඔවුන්ට සිහිපත් කිරීමේ සිටීමට නොහැකි බැවින් බොහෝ දරුවන් අංගසම්පූර්ණ වීමෙන් අසමත් වෙයි. පියා දැන් ඔබට පෞරාණික රාජයෝගාව උගන්වනවා. පියා පවසන්නේ මංම පැමිණ ඔබට රාජයෝගාව උගන්වනවා. දැන් මා සිහි කරන්න! ඔබ මා වෙතට පැමිණිය යුතුයි. මෙය සිහිපත් කිරීමේ වන්දනාවයි. එය ඔබගේ මිහිරි නිහඬ නිවහනයි. ඔබ භාරතයට ගොස් ඔබගේ සම්පූර්ණ උරුමය හිමි කරගන්නා බව, භාරතයේ වැසියන් වන ඔබලාට වැටහෙයි. පියා ඔබට නැවත නැවතත් පහදා දෙයි ඔබගේ පොරොන්දුව සම්පූර්ණයෙන්ම ඉටු කරන්න! ඔබ අතින් වරදක් සිදුවන්නේ නම්, පියාගෙන් සමාව ඉල්ලන්න. බලන්න, මේ දරුවා විශේෂයෙන්ම පියා වෙතට එක දිනකට පැමිණ සිටින්නේ සමාව ඉල්ලීමටයි. ඔහු අතින් සුළු වරදක් සිදු වුණු අතර ඔහු එබැවින් මෙහි දිව ඇවිත්. ඔහුගේ යටි හිත වද දුන් බැවින්, ඔහු පෞද්ගලිකවම බාබා වෙතට පැමිණ, සෑම දෙයක්ම බාබාට පාපොච්චාරණය කළ යුතු බව සිතුවා. පරම පියා කෙරෙහි ඔහු තුළ එතරම් ගෞරවයක් තිබේ. බොහෝ දරුවන් මෙයට වඩා බොහෝ සේ පාපක්‍රියා සිදුකරන අතර ඔවුන්ට ඒ ගැන අවධානයක් වත් නැත. පියා පවසන්නේ අපූරු දරුවා! ඔබ ඉතා හොඳයි. ඔබ සුළු වරදක් කළ අතර, සමාව අයදීමට ඔබ පැමිණියා. බාබා පවසන්නේ සෑම විටෙකම බාබාට ඔබගේ වැරදීම් ගැන කියා, සමාව ඉල්ලන්න. එසේ නැත්නම් එම පාපය දිගින් දිගටම වර්ධනය වී, ඔබ ඉන්පසුව ඇද වැටෙයි. ප්‍රධානතම දෙය වන යෝගාව තුළින් පමණයි ඔබට බේරී සිටිමට හැකි වන්නේ. මෙම යෝගාවේ විශාල අඩුවක් තිබේ. දැනුම ඉතා පහසුයි. එය කතාන්තරයක් මෙනි වසර 5000 කට පෙර එය කාගේ රාජධානියද වූයේ, එමෙන්ම ඔවුන් එය පාලනය කළේ කෙසේද ඔවුන් කෙතරම් කාලයක් එය පාලනය කළාද, එමෙන්ම රාජධානිය පාලනය කරන අතර ඔවුන් පාපයන් තුළ සිරගත වූයේ කෙසේද. කිසි කෙනෙක් ඔවුන්ව පරාජය කළේ නැත ඔවුන් පරාජය වූයේ පසුවයි, ඔවුන් වෙළෙන්දන් වූ විටයි. රාවණ ඔවුන්ගේ රාජධානිය ඔවුන්ගෙන් පැහැර ගත්හ. ඔබ නැවත වරක් රාවණ පරාජය කරමින් ඔබගේ රාජධානිය ඔහුගෙන් හිමි කරගන්නවා. මෙය වුවත් පතිත වන්නේ ඉතාම සුළු පිරිසකගේ බුද්ධිය මත පමණයි. පියාට සම්පූර්ණයෙන්ම කීකරු සහ විශ්වාසවන්ත අය සිටිනවා. ඇතැම් සේවකයන් බොහෝ විශ්වාසවන්තයි. රුපියල් සිය දහස් ගණනක් පෙනෙන්නට තබා තිබුණත්, ඔවුන් එක රුපියලක්වත් ගන්නේ නැත. ඔවුන් පවසන්නේ මහත්තයා යතුර දමා ගියා, එබැවින් මා එය පරිස්සම් කර ඔබට ගෙනාවා. එවන් මිනිසුන් තවමත් සිටියි. පියා ඔබට දිගින් දිගටම ඉතා පැහැදිලිව විස්තර කරයි. බුද්ධිය පවසන්නේ මෙය නිසා ඇතැමුන්ට මාලාවේ පබුළු වීමට නොහැක. එබැවින් ඔවුන් එහි ගොස් සේවකයන් සහ දාසයන් බවට පත් වෙයි. ඔවුන් ඉගෙන ගන්නේ නැති නිසා, එය අනිවාර්යෙන්ම ඔවුන්ගේ තත්ත්වය වෙයි. ඔවුන් ශ්‍රීමත් පිළිපදින්නේ නැත. පරම පියා විස්තර කරන්නේ ඔබගේ අරමුණ වන්නේ යෝගාවයි. මායා ඔබව මුළුමනින්ම නාසයෙන් අල්ලා ගෙන, ඔබට යෝගාවේ සිටින්නට ඉඩ නොදෙයි. ඔවුන් යෝගාවේ සිටියේ නම් ඔවුන් ඉතා හොඳින් සේවය කරනු ඇත. පාපය පිළිබඳව බියක් තිබිය යුතුයි. මෙම දරුවා ඉතා හොඳය. අවංකකම තිබෙන්නේ නම් එය එසේ වනු ඇත. මෙම කෙනාගේ තත්ත්වය, සමහර හොඳ දරුවන්ගේ තත්ත්වයටත් වඩා හොඳයි. සේවය කරන අය කොහේ හෝ තැනක සිරවී සිටියි ඔවුන් බාබාට කිසිවක් නොකියයි. ඔවුන් සිර වී සිටින දේ අත්හරින්නට යැයි කියූ විට පවා ඔවුන් එය නොකරයි. ගීතයේ ඔවුන් පොරොන්දු වූයේ කුමක් සිදු වුවත් මා එවන් වරදක් යළි නොකරන්නෙමි.

ප්‍රධානතම දෙය වන්නේ ශරීර අවධානයයි. ඔබ අතින් වැරදි සිදුවන්නේ ශරීර අවධානය නිසයි. බොහෝ දෙනෙක් අතින් වැරදි සිදුවෙයි, ඔබට සැලකිලිමත් වීමට කියා පවසන්නේ මේ නිසාය. පියාගේ වගකීම වන්නේ ඔබට විස්තර කර දීමයි. ඔහු විස්තර නොකළේ නම්, ඔබ මෙසේ කියනු ඇත කිසි කෙනෙක් අපට මේ ගැන කීවේ නැහැ! මේ මත පදනම් වුණු කතාපුවතක් ඇත. පරම පියා පවසන්නේ දරුවනි, ප්‍රවේසම් වන්න! එසේ නැත්නම් බොහෝ දඬුවම් විඳින්නට සිදුවෙයි. එවිට මෙසේ නොකියන්න මේ ගැන අපට කලින් නොකීවේ ඇයි? පියා ඔබට සෑම දෙයක්ම ඉතා පැහැදිලිව විස්තර කරයි. ඔබ සුළු පාපයක් හෝ සිදු කරන්නේ නම්, එය බොහෝ සේ වැඩි වී, එවිට ඔබට පියා ඉදිරියේ ඔබගේ හිස එසවීමට නොහැකි වෙයි. බොරු කියනවා වෙනුවට ඔබ පාපොච්චාරණය කර, සමාව අයැදිය යුතුයි. ශිව බාබාට ඔබව නොපෙනෙනවා යැයි නොසිතන්න. ඔහු අවිදු මාවතේද සෑම දෙයක්ම දන්නා අතර, පාපයන් සහ පුණ්‍යකර්මයන්හි ඵලය ඔහු ආපසු ලබා දෙන්නේ ඒ නිසාය. ඔහු ඔබට ඉතා පැහැදිලිවම පවසන්නේ ඔබ පාපයන් සිදු කරන්නේ නම්, ඔබට ඉතා දැඩි දඬුවම් තිබෙයි. ඔබ මෙහි පැමිණ සිටින්නේ පියාගෙන් ඔබගේ උරුමය හිමි කරගැනීමටයි. ඒ වෙනුවට ඔබ ඔබගේ කන් දෙකම කපා නොගත යුතුයි! ඔවුන් එකක් පවසන අතර වෙන කෙනෙක්ව සිහි කරයි. පියාව සිහි නොකරන අයගේ තත්ත්වය කුමක් වෙයිද? පිවිතුරු ආහාර කෑම, සත්‍යය කතා කිරීම, වාම් ඇඳුම් පැළඳීමෙන් හැඳින්වෙන්නේ, මේ කාලය ගැනය. පරමාත්ම පියා පැමිණ ඔබට උගන්වන බැවින්, ඔබ සෑම ආකාරයකින්ම ඔහුට අවංක විය යුතුයි. අච්චා.

එවන් අවංක, ශ්‍රද්ධා විශ්වාසයෙන් යුතු හා කීකරු දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. අවංකව පියාගේ සේවයේ තමන්ව කාර්යබහුල කරගන්න. සම්පූර්ණයෙන්ම අවංක සහ විශ්වාසවන්ත වන්න. දෙවියන්ගේ පවුලේ අයට සැබෑ සෙනෙහස ඇති කරගන්න.
2. ශ්‍රීමත් සමඟ, ඔබගේ මනසේ මත හෝ රාවණගේ මත, මිශ්‍ර කර නොගන්න. පියාට හැර වෙනත් කිසිවෙකුට අයත් නොවීමේ සහතිකය, ස්ථාවරව තබාගන්න. ඔබගේ හදවත පිවිතුරු සහ පිරිසිදුව තබාගන්න.

**වරදානය:** ඔබ ලොවට සෙත සලසන්නෙක් වී, ඔබගේ ආධ්‍යාත්මිකත්වයේ සුගන්දයෙන් සියළු දෙනාට පරමාත්ම දෙවියන්ගේ පණිවිඩය ලබා දෙත්වා.

ආධ්‍යාත්මිකත්වයේ සියළුම බල ධාරණය කරගන්න එවිට ඔබගේ ආධ්‍යාත්මිකත්වයේ සුගන්දය, සියළු ජීවාත්මයන්ව ඔබ වෙතට පහසුවෙන් ආකර්ෂණය කරගනී. ඔබගේ මනසේ බලයෙන් ඔබට තමෝප්‍රධාන් පදාර්ථ, සතෝප්‍රධාන් කිරීමට හැකි බැවින් එසේ නම් ඔබ ඉදිරියට පැමිණීමට නොහැකි ජීවාත්මයන්ට දුර සිට වුවද පරම පියාගේ ප්‍රධාන පණිවිඩය ලබා දීමට ඔබගේ ආධ්‍යාත්මිකත්වයේ බලය භාවිතා කරන්න. ඔබ මෙම සියුම් යාන්ත්‍රණය වේගවත් කරන විට මංමුලාවී සිටින බොහෝ ජීවාත්මයන්ට යම් දෙයක බිඳක් ලැබී, ඔබ ලොවට සෙත සලසන්නෙක් ලෙස හැඳින්වෙයි.

**පාඨය:** තමන් තුල පිවිතුරු සහ ශ්‍රේෂ්ඨ සිතිවිලි මතු කරගන්න එවිට සියළු නිෂ්ඵලත්වය ඉබේටම යටපත් වෙයි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබගේ විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් කරගෙන නිරන්තරයෙන් නොබියව සහ සැහැල්ලුවෙන් රැඳී සිටින්න.**

යම් අහිතකර සිදුවීමක් ඔබ ඉදිරියට පැමිණෙන ඕනෑම විටෙක, පරම පියාව ඔබගේ සහකරු කරගන්න, එවිට ඔබ තනිවී නොමැති අතර යම් විශේෂ බලයක් ඔබ සමග සිටින බව ඔබ අත්දකිවි. කෙතරම් කුණාටු පැමිණියත්, පියා ඔබ සමග සිටින විට එම කුණාටු තිළිණයක් බවට පත් වෙයි. ජයග්‍රාහී ජීවාත්මයක් වී, මෙම තේමාවේ අවධානයෙන්, ජයග්‍රාහී වර්ෂය සමරන්න, “බුද්ධියේ විශ්වාසය ඇති අය ජය ගනියි.”